දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

# ආවිසා 2.1 - සූක්ෂම ආර්ථික න්‍යාය
# ECG 2.1 - Micro Economic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
(පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න)

---

01. (අ) පාරිභෝගික හැසිරීම පිළිබඳ උපේක්ෂා වක්‍ර විග්‍රහය පාරිභෝගික හැසිරීම පිළිබඳ ආන්තික උපයෝගිතා විශ්ලේෂණයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් බාල භාණ්ඩ හා ගිෆන් භාණ්ඩ වෙන් කොට හඳුනාගත හැකි ආකාරය ප්‍රස්තාර සටහන් භාවිතා කරමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

02. උපේක්ෂා වක්‍ර විග්‍රහය ඇසුරින් පහත සඳහන් ප්‍රකාශ පැහැදිලි කරන්න.

(අ) "උපේක්ෂා වක්‍රයක සෑම ලක්‍ෂයකම ඇත්තේ සමාන තෘප්ති මට්ටමකි. එවැනි වක්‍ර දෙකක් එකිනෙකට ඡේදනය නොවේ."

(ආ) "ආදායම් පරිභෝජන රේඛාවේ ඒ ඒ ලක්‍ෂවලදී ආන්තික ආදේශන අනුපාතය භාණ්ඩ දෙකේ මිල අනුපාතයට සමාන වේ."

(ඇ) "කෝණීය විසඳුම් අවස්ථාවකදී පාරිභෝගිකයා සමතුලිත වනුයේ භාණ්ඩ වර්ග දෙකෙන් එක් වර්ගයක භාණ්ඩ පමණක් මිලදී ගැනීමෙනි."

(ඈ) "ස්වයංපෝෂිත ආර්ථිකයකට වඩා හුවමාරු ආර්ථිකයක් සමාජ සුභ සාධනය ඉහලට යොමු කරයි."

(ලකුණු 20 යි)

03. (අ) නිෂ්පාදන ශ්‍රිතයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවනු ලබන නියමයන් කවරේදැයි පැහැදිලි කරන්න.

(ඇ) කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දක්වා එහි විශේෂ ලක්‍ෂණ පැහැදිලි කරන්න.

(ඈ) ප්‍රත්‍යක්‍ෂමූල අධ්‍යයනයන් හි දී කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතය වඩාත් ප්‍රචලිත වීම කෙරෙහි තුඩුදුන් සාධක කවරේද යි විස්තර කරන්න.

(ලකුණු 20 යි)

04. (අ) සම නිෂ්පාදන වක්‍රයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) නිෂ්පාදන ක්‍රියාවලියේ දී භාවිතා කරන සාධක එකිනෙක අතර ආදේශ කිරීමේ හැකියාව මත අදාළ සම නිෂ්පාදන වක්‍රයේ හැඩය තීරණය වන ආකාරය ප්‍රස්තාර සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ඇ) සම නිෂ්පාදන වක්‍ර සම්බන්ධව පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

i. ආන්තික ශිල්පීය ආදේශන අනුපාතය (MRTS) සහ ප්‍රශස්ත සාධක සංයෝගය.

ii. ආර්ථික කලාපය සහ වැටි රේඛා

(ලකුණු 20 යි)

05. (අ) ලාභ උපරිම කිරීම අරමුණු කරගත් ඒකාධිකාරයකු සිය නිෂ්පාදිත භාණ්ඩය වෙළඳ පොළවල් දෙකක මිල විශේෂණය කරමින් අලෙවි කරයි. ඔහුගේ මුළු පිරිවැය ශ්‍රිතය හා ඒ ඒ වෙළඳ පොළේ ඉල්ලුම් ශ්‍රිතයන් පහත දක්වේ.

මුළු පිරිවැය ශ්‍රිතය $TC = 2000 + 10Q$

පළමු වෙළඳ පොළේ ඉල්ලුම් ශ්‍රිතය $P_1 = 210 - 10Q_1$

දෙවන වෙළඳ පොළේ ඉල්ලුම් ශ්‍රිතය $P_2 = 125 - 2.5Q_2$ වේ.

මෙහි $P_1$ = පළමු වෙළඳ පොළේ මිල

$P_2$ = දෙවන වෙළඳ පොළේ මිල

$Q_1$ = පළමු වෙළඳ පොළේ ප්‍රමාණය

$Q_2$ = දෙවන වෙළඳ පොළේ ප්‍රමාණය

$Q = Q_1 + Q_2$ වේ.

ලාභ උපරිම කරන අවස්ථාවේ දී ඒකාධිකාරයාගේ ලාභය ගණනය කරන්න.

(ලකුණු 08 යි)

(ආ) මිල විශේෂණය පාරිභෝගිකයාට අවාසිදායක වන ආකාරය විස්තර කර, මිල විශේෂණය පාරිභෝගිකයාට වාසිදායක වන අවස්ථාවක් තිබේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

(ඇ) ඒකාධිකාරයකු මුළු අයභාරය උපරිම කරන අවස්ථාවේදී ආන්තික අයභාරය සහ ඉල්ලුම් නම්‍යතාව අතර ඇති සම්බන්ධතාව $P = 120 - 5Q$ යන ඒකාධිකාරයකුගේ ඉල්ලුම් ශ්‍රිතය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

06. (අ) "අහිමි වන ශුද්ධ සුභ සාධනය" යන්නෙන් අදහස් කරනුයේ පූර්ණ තරඟකාරී වෙළෙඳ පොළක් ඒකාධිකාරී වෙළඳ පොළක් බවට පරිවර්තනය වීමෙන් සමාජයට ඇතිවන අයහපත් ප්‍රතිඵලයකි. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(ආ) "ඒකාධිකාරී තරඟ ආයතනයකට දිගු කාලීන සමතුලිතයේ දී පවා සාමාන්‍ය පිරිවැය වක්‍රයෙහි අවමයෙහි නිෂ්පාදනයේ නිරත විය නොහැකිය." මෙම ප්‍රකාශය සනාථ කර එහි ආර්ථික ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

(ඇ) “කතිපයාධිකාරය පිළිබඳ එජ්වර්ත් ගේ විග්‍රහය තුල කුනෝට්ගේ විග්‍රහයේ දී මෙන් සමතුලිත අවස්ථාවකට එළඹීමක් නැත.” කතිපයාධිකාරය පිළිබඳ මෙම විග්‍රහයන් දෙක විස්තර කරමින් ඉහත ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව තහවුරු කරන්න.

(ලකුණු 08 යි)

07. (අ) “සාධක වෙළෙඳ පොළ තුල ඒකාධිකාරී සූරාකෑම ඇතිවනුයේ සාධක වෙළඳ පොළ අපූර්ණ තරඟයේ පැවතීම නිසා නොව භාණ්ඩ වෙළෙඳ පොළ ඒකාධිකාරී වීම නිසාවෙනි.” මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

(ආ) “සම්ප්‍රදායික ආර්ථික විග්‍රහය තුල ලාභය ව්‍යවසායක කාර්ය වෙනුවෙන් ලබන ඉපයීමක් ලෙස සැලකූ නමුත් වර්තමාන වෙළෙඳ පොළ සංවිධාන ව්‍යුහය සමඟ සැසඳීමේදී එම අදහස තාර්කික නොවේ.” සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

(ඇ) “නිෂ්පාදන සාධකයක සැපයුම අනම්‍ය වන තරමට එහි ඉපයුමෙන් වැඩි කොටසක් ආර්ථික බදු කුලිය වේ.” මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 06 යි)

08. පහත සඳහන් ඕනෑම සංකල්ප <u>හතරක්</u> විස්තර කරන්න.

1. සිරකරුවන්ගේ උභතෝකෝටිකය
2. ක්‍රයේකාධිකාරී සූරාකෑම
3. ප්‍රකාශිත වරණ න්‍යාය
4. ස්විසිගේ නැමුණු ඉල්ලුම් වක්‍ර විග්‍රහය
5. ආරූඪ බදු කුලිය
6. නිෂ්පාදනයේ අදියර තුන

(ලකුණු 20 යි)